2021.4.23 දිවයින

පිටුව 2

# උද්ධමනය වැඩිවෙයි

ශාමි නුවන් ගුණවන්ත

පසුගිය මාර්තු මස උද්ධමනය සියයට 5.1 දක්වා ඉහළ ගොස් ඇත. ඉකුත් පෙබරවාරි මාසයේ පැවැති උද්ධමනය සියයට 4.2ක් විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මේ උද්ධමනය ගණනය කර ඇත. 2020 මාර්තු මාසයේ පැවති පහළ පදනම් අගය මගින් ඇති වූ සංඛ්‍යානමය බලපෑම මාර්තු මාසයේ උද්ධමනය ඉහළ යෑම සඳහා හේතු වී තිබේ.

මේ අතර, ආහාර කාණ්ඩයේ වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2021 පෙබරවාරි මාසයේ දී පැවැති සියයට 6.9හි සිට 2021 මාර්තු මාසයේ දී සියයට 8.8 දක්වා ඉහළ ගිය අතර ආහාර නොවන කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2021 පෙබරවාරි මාසයේ පැවැති සියයට 1.9හි සිට 2021 මාර්තු මාසයේ දී සියයට 2.0 දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය.